දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA


මගේ අංකය )
எனது இல ) PA/EOH/FCAU/43/2017
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.05. 24
Date )


# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

විධාන අංක :- 01/2019

සියළුම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන්,
අධ්‍යක්ෂ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී මහ නගර සභාව /කොළඹ/මහනුවර,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්.

**ආහාර වර්ණ සංකේතවත් කිරීමේ (සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග 2019 සම්බන්ධයෙන් ආහාර පනතේ බලධාරීන් සහ බලයලත් නිලධාරීන් දැනුවත් කිරීම.**

1980 අංක 26 ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් 2019 අප්‍රේල් මස 17 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්පත්‍රයේ පලකරන ලද අංක 2119/3 දරන ආහාර වර්ණ සංකේතවත් කිරීමේ (සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝගය 2019 ජුනි මස 01 වන දින සිට බලාත්මක වේ.

මෙම නියෝග යටතේ ඝණ හා අර්ධ ඝණ ආහාර වල අඩංගු සීනි, ලුණු සහ මේද ප්‍රමාණය වර්ණ සංකේත තුලින් පෙන්නුම් කරනු ලබයි.

මෙම නියෝග පැනවීමේ මූලික පරමාර්ථය වනුයේ ආහාර වල අඩංගු සීනි, ලුණු සහ මේද ප්‍රමාණය පාදක කරගෙන ශ්‍රී ලංකාව තුල දැනට වර්ධනය වෙමින් පවතින බෝනොවන රෝගවලින් පෙලෙන අයවළුන් හට ආහාර තෝරා ගැනීමේදී මගපෙන්වීමටත් පොදුවේ ලංකා වාසී සියළුම දෙනාට ඉහත ආහාර සම්බන්ධයෙන් අවබෝධාත්මක පෙළඹවීමක් ඇතිකිරීමටත් වේ.

2019-06-01 දිනෙන් පසුව නිෂ්පාදනය කරනු ලබන ඝණ හා අර්ධ ඝණ ආහාරවල වර්ණ සංකේතවත් කිරීම නිසි අයුරින් සිදු කිරීම සඳහා ඔබ කොට්ටාශය තුල සිටින නිෂ්පාදකයින් හට මග පෙන්වීම බලයලත් නිලධාරීන් මගින් සිදුකිරීම කල යුතුව ඇත.

මෙම නියෝග ප්‍රායෝගිකව බලාත්මක කිරීම සඳහා ආහාර නිෂ්පාදකයින් තම ආහාර නිෂ්පාදන රසායනාගාර පරීක්ෂාවට භාජනය කර එහි අඩංගු සීනි, ලුණු සහ මේද ප්‍රමාණය තීරණය කරගත යුතු බැවින්ද ඒ සඳහා රසායනාගාර පහසුකම් ඇත්තේ කොළඹ පමණක් වන බැවින්ද මෙම

කටයුත්ත ප්‍රායෝගිකව ඉටුකරගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබාදිය යුතු බැවින් මාස 03ක සහන කාලයක් මේ සඳහා ලබාදෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

ඒ අනුව තම බල ප්‍රදේශය තුල 2019 සැප්තැම්බර් 01 වන දින සිට නිෂ්පාදනය කරනු ලබන ආහාර සඳහා මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට වැඩිදුරටත් දන්වා සිටින අතර මෙම කාලය තුල එම ආයතන වලට අදාල රෙගුලාසි සඳහා අනුගත වීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දීමට කටයුතු කරන ලෙසද දන්වා සිටිමි.

තවද කිසියම් බලයලත් නිලධාරියෙකුට වර්ණ සංකේත යටතේ දක්වා ඇති සීනි, ලුණු සහ මේද ප්‍රමාණන් සම්බන්ධයෙන් සැකයක් මතුවන්නේ නම් ඒ පිලිබඳව ආහාර පාලන ඒකකය විමසා කටයුතු කල යුතුය. කිසියම් ආහාරයක වර්ණ සංකේතයට අදාලව දක්වා ඇති සීනි, ලුණු සහ මේද ප්‍රමාණය නිවැරදිද යන්න පරීක්ෂා කිරීමේදී මතුවන විවිධ තාක්ෂණික අභියෝගයන් සැලකිල්ලට භාජනය කල යුතු බැවින් එම කාර්යය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය මගින් ඉටු කරනු ලබනු ඇත.

වෛද්‍ය ලක්ෂමන් ගම්ලත්,
වැ.බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
(ප්‍රධාන ආහාර බලධරයා)

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.